




සිසිර දිසානායක

''අද හොඳා'' පින්සල ගෙට ගොඩ වෙන ගමන් කිව්වා.
''හැමෝටම හවුල් වෙන්න ඉඩ දීලා තිබුණා. හැමෝ ම විනෝද වුණා.''

ස්කැට් සංවිධානය සංවිධාන කරලා තිබුණා ''රසකළස'' කලාකාමී හිතවතුන්ට හොඳ අවස්ථාවක් වුණා.
''කැපී පෙනිලා ඉස්මතු වෙන්න කවුරුවත් දඟලුවේ නෑ.''
''දැගලුවාට වැඩක් වෙන්නේ නෑ. හරි දේ මොකක්ද කියලා බලා ඉන්න අය තේරුම් ගන්නවා. ඒ හන්දා හරි දේ හරියට කරන එක තමයි හරි.'' පන් කිව්වේ ටිකක් හැඟීම් බර වෙලයි.
''කලාව කියන එක හරියට පිරිසිදු දෙයක්. ඒකට විෂබීර එකතු කර ගන්නෙ නැතිව පරිහරණය කරන එක කලාකාරයින්ගේ යුතුකමක්. ''පින් ඌන පූර්ණය කිව්වා.

ඒ වුණාට තමන් ළඟින් ඉඳගෙන අහිංසක විදියට රසකතා, කවි මඩුව, ගී සින්දු රසවින්ද පින් ගැන පන්ට ඇතිවුණෝ පොඩි දුකක්. චිත්‍ර කලාව හැමවෙලාවෙම පසුබිමේ ඉඳගෙන තමන්ගේ වගකීම ඉෂ්ඨ කරලා ඒ දෙයින් ආලෝකය ලබන අනික් කලාවන්ට ඉඩදීලා නිහඬව ඒ දේවල් රස විඳිනවා. මේ පාර පින්ට යමක් ලියන්න ඉඩ දෙන්න පන්ට හිතුණෝ ඒ නිසයි.

'ඩැංඩිනොං'' පුස්තකාලෙදි එදා මං පොඩි සමීක්ෂණයක් කළා. ඒ ගැන ලියමු.'' පින් එකඟ වුණා.

''හරිම අගෙයි ඩැංඩිනොං පුස්තකාලෙ සිංහල අංසෙ'' පින් ලියන්න ගත්තා. වයිව-ාරන්න පොත් ගොඩයි. ඒත් ඒවා ඇතුළෙ තියෙන්නෙ අහවල් දේ ද කියල නං මට ලියන්න කියන්න එපා. පිටකවර ඇතුලෙ බොහොම වටින දැනුම සම්භාරයක් තියෙන බව දැනුණාට මට ඉතින් වටින්නෙ පොත්වල පිටකවර. කවුද මේ ඒව මේව ඇඳලා හැඩ කරලා තියෙන්නෙ කියලා හොයල බලන්න හිතුණා මට. පෙළක් පිටකවරවලනං

## කංචුක කලාව

පිටකවරෙම ගහලා තිබුණා. සමහරක් ඒවායේ ඇතුල් පිටක අච්චු ගහලා තිබුණා. තවත් සමහරක් ඒවායේ පෙරවදන, ස්තූතිය වගේ කොටස් කියවන්න වුණා. ඒත් සමහරක් ඒවයෙ මොකුත්ම ඇත්තෙ නෑ. තමුන්ගෙ වටිනා පොතට හැමෝගෙම ඇස් බන්දා ගන්න කවරෙ කළේ කවුද කියල සඳහනක් නැති එක ගැන නං සතුටු වෙන්න බෑ....''

සමහර පොත්වල කවරෙ නිර්මාණ කරපු ඇත්තො ගැන ලියවිලා තිබුණෙ ''කංචුක නිර්මාණය'' කියලයි. සුනිල් ආරියරත්න මහාචාර්යවරයාගේ ''මහින්ද ප්‍රබන්ධ'' පොතේ ඒ ගැන ලියවිලා තිබුනේ ''කම්බ අලංකරණය'' කියලා. කංචුකය එහෙම නැත්තං කම්බ, එහෙමත් නැත්තං පිටකවරය නිර්මාණය කරනා මූලික ක්‍රම දෙකක් තියෙන බවයි පේන්නෙ. චිත්‍රයකින් පිටකවරය සරසන එක තමයි පුරාණයේ ඉඳන් තිබිලා තියෙන්නේ. ඒත් පරිගණකය, සිංහලෙන් කිව්වොත් කොම්පියුටරේ ආවයිං පස්සේ ග්‍රැෆික් ක්‍රමේටත් පිටකවර සැරසිල්ල පටන් ගත්තා. ඔය ක්‍රම දෙකම මුහුකරගෙන කරපු කවරත් තියෙනවා. හැබැයි ඉතිං මගේ නං හිත ගියෙ චිත්‍රවලින් විතරක් සැරසුණ කවරවලට. පිටකවර චිත්‍රකලාව, එහෙම නැත්තං කංචුක කලාව වෙනම ම කලාවක් ය කියලයි මට නං හිතෙන්නෙ.

පුස්තකාලෙ තිබුණ පොත් අතරේ කංචුක කලාව බොහොම දුරට වෙනම කලාවක් විදියට යොදාගෙන තිබුණෙ සෝමසිරි හේරත්, දී.ග. සෝමපාල කියන කලාකරුවෝ දෙන්නා කියලා කිව්වොත් මම වැරදි නැතිව ඇති. සෝමසිරි හේරත්ගේ කවර ඒවා එයාගෙමයි කියලා කියන්න බැරි තැමට එකිනෙකට වෙනස්. දයාපාල ජයනෙත්තිගේ ''බඹර කවි වරුණ'' පොතට ඇන්ද ඇඳිල්ල නෙවෙයි උන්නැහේ බුද්ධදාස ගලප්පත්තිගේ ''නිශ්චලයි රාත්‍රිය'' ට ඇඳලා තියෙන්නේ. කීර්ති වැලිකන්නගේ ''කළු කහවනු'' පොත් කවරෙයි, ''ද්‍රෝහියෙකුගේ අභ්‍යන්තර කතාව'' පොත් කවරෙයි එකිනෙකට වෙනස්. දයාපාල ජයකොඩිගේ ''පුතුන් එනතුරු මඟ බලනෙමි'' ඊටත් වෙනස්. ටෙනිසන් පෙරේරාගේ ''ඔච් නගරයෙන් බෑ නගරයට'' කවරයත් උන්නැහේගේමයි. හැබැයි ටී.බී. ඉලංගරත්නගේ ''අඹ යාළුවෝ'', ''ශිෂ්‍යත්වය'', ''කැලෑ මල්'' පොත් පෙළට පිටින්ම වෙනස් චිත්‍රයක් බව කියන්න ඕන. ශාන්ත කේ. හේරත්, ගුණදාස අමරසේකරගේ ''මරණ මංචකයේදී දුටු සිහිනය'', පොතට ඇන්ද කවරයත්, ලක්ෂ්මන් කහටපිටිය, ඉන්ද්‍රා කුමාරි කහටපිටියගේ, ''මුරකරුවාගේ රාත්‍රිය'' ට ඇඳපු කවරයත් කලාත්මක බව නිසා හිත ඇදල ගන්නවා. කවිපොත්, කෙටි කතා පොත්වලට ටිකක් කලාත්මක කවර කෙරෙන බවයි පෙනෙන්නේ. ඇත්ත චරිත ගැන ඒ ලියවෙන පොත්වලට පෝට්‍රේට්ස් අඳින්න උනන්දු වෙනවා වගෙයි.

කලාකරුවන්ගේ නම් ගම් මග ඇරිලා



ඇඳලා තියෙන්නේ ඔයිට හාත්පසින්ම වෙනස් චිත්‍ර. ඒවායේ මිනිස් චරිත, ළමා චරිත පරිමාණයකට ඒත් එක විදියක ලාලිත්‍යයකට ඇඳිලා. ඔය මං මුලින් කිව්ව කවරවල චිත්‍ර ටිකත් සම්භාව්‍ය පැත්තට බරයි. ''නිශ්චලයි රාත්‍රිය'' වඩාත් ඒ පැත්තටම බර වෙලා. පොතේ ලියවිලා තියෙන දේවල් හැටියට වෙන්නැති. ඒකනෙ ''අඹයාලුවෝ'' කතාවට ළමයින්ගෙ හිත් ඇඳ ගන්නා විදියට කවර ඇන්දෙ. ''බඹර කවි වරුණ'' පොතේ තියෙන්නෙ බඹර පනික්කියෙක් බඹර කඩන රූපයක්. ඒත් ඒක පරණ පන්සල් චිත්‍රවල ආරෙට රේඛාවලින් වට කර පාටකල චිත්‍රක් විදියටයි සකස් වෙලා තියෙන්නේ.

දී.ග. සෝමපාලත් වෙනස් වෙනස් ආකාරවලට කවර ඇඳපු ශිල්පියෙක්. මේ අතරින් රේඛාවලින් ඇඳපු, ඒත් තමන්ගේ හිතුමතේට පාට ගලපාපු කවර තමයි සෝමවීර සේනානායකගේ ''මැණික් නදිය ගලා බසී'' කවරයත් ''මචකගේ ගීතය'' කවරයත්, දී.ග.ට අපූරු හැකියාවක් තියෙනවා. එක එක චරිත පින්තූර ගත්තා වාගේ අඳින්නට. අපි සිංහලෙන් ''පෝට්‍රේට්ස්'' කියන්නෙ අන්න ඒවාට. සමහර විට මේ පෝට්‍රේස්ට් රේඛාවලින් වටවෙනවා. ඒ විදියට කරපු වැඩක් තමයි මම අර මුලින්ම කිව්ව ''මහින්ද ප්‍රබන්ධ'' ඒ ඇරුණම ඒ.ඩී. රංජිත් කුමාරගේ ''කොස්ගස් හන්දියත්'' ඒ වගේම ඇඳපු චිත්‍රයක්. හරිම අගෙයි ඒ වැඩේ. පාටවලින් ඇඳපු චිත්‍රය උඩ ඒ මේ අතට කලු හීනි රේඛාවලින් එළිය අඳුර පෙන්නලා ඇන්ද පෝට්‍රේට්ස් විදියට සෝමවීර සේනානායකගේ ''අපි තවමත් සංසාරේ'' කවරය පෙන්නලා දෙන්න පුලුවන්. ඒ වැඩේට තවත් රුසියෙක් ප්‍රේම් දිසානායක කලාකරුවා. ''ජයවිලාල් විලේගොඩගේ'' තෝරාගත් සිනමා විචාර ''එච්.ඩී. ප්‍රේමරත්නගේ ''සිනමා සෞන්දර්ය චාරිකා'' පොත් දෙක හොඳ උදාහරණ. මොනවා වුණත් නන්දසේන රත්නපාලගේ ''ලංකාවේ යාචකයා'' පොත් කවරයට දී.ග. නිර්මාණය කරලා තියෙන්නේ අරවාට එහෙම තිබුණත් කලාත්මක වටිනාකමක් තියෙන කවර විදියට ඒ.වී. සුරවීර මහාචාර්යවරයාගේ ''ගොදුරු ලොබ'', එදිරිවීර සරච්චන්ද්‍ර මහාචාර්යවරයාගේ ''රූප සුන්දරී'', ''ආර්.ආර්. සමරකෝන්ගේ '' සඳඑළිය කළුවරයි'', මාර්ටින් වික්‍රමසිංහ මහත්තයාගේ ''ගම්පෙරළිය'' (26 මුද්‍රණය - 2004 වගේ පොත්වල කවර ගැන ලියන්න පුලුවනි.

පුරාණයේ අපේ ඇත්තෝ කරපු චිත්‍ර, කැටයම් එහෙම යොදාගෙන කරපු කවර ගැනත් යමක් ලිව්වොත් හොඳයි කියලා හිතෙනවා. මොකද ඒවායේ කලාත්මක බව නිසාම, බොහෝම හිත් ඇඳිලා ගියා මාලිංග අමරවංශගේ ''සිංහලේ පුරාණ ඇඳුම් ආයිත්තම්'' කවරයට. අහන්න දෙයක් යෑ ඉතින්. ඒත් කවරෙ කරපු කෙනාගෙ නම නං හොයාගන්න බැරිවුණා. පී.ඇම්. සේනාරත්නගේ ''ශ්‍රී ලංකාවේ ජනක්‍රීඩා'' පොතට යොදාගෙන තියෙන්නේ ඇම්බැක්කේ ලී කැටයමක්. පසුබිමේ තියෙන්නේ සෙල්ලිපියක අකුරු. ''ශ්‍රී ලංකාවේ ජාතික සංබේත'' කවරයත් එහෙමයි. ඔය එකකවත් කවරය කළ අයගේ නම් නැත්තේ ඒවා පුරාණ දේවල් පරිගණකයෙන් පිළියෙල කරගත් ඒවා හන්දා වෙන්න ඇති. අනුරාධ සෙනෙවිරත්න මහාචාර්ය තුමාගේ ''ගෞතම බුද්ධ ශාක්‍යමුණි'' පොත් කවරය කලාශූරී එස්.පී. චාර්ලිස්ගේ චිත්‍රයක් යොදාගෙන කරලා තියෙන්නේ කේ.ඩබ්ලිව්. ජනරංජන.

ලංකාවේ ප්‍රසිද්ධ චිත්‍රකතා ශිල්පීන් දෙන්නෙකු ගැනත් ලියලාම මේ ලියුම ඉවර කළොත් හොඳා. කේ.ඩී. කරුණාතිලකගේ පරිවර්තන පොත් පෙළකටම චිත්‍ර ඇන්ද බන්ධුල හරිස්චන්ද්‍ර ශිල්පියා, ජයසේන ජයකොඩිගේ ''යසෝදාව'' කවරයට ඇඳපු චිත්‍රය බොහෝමත්ම ශාන්තයි. චිත්‍රකතාවල ආරයට පාට පාටින් ඇඳලා කළු ඉරිවලින් වටකරලා ඇන්ද අනික් චිත්‍රවලට වඩා ''යසෝදාව'' වෙනුවෙන් උන්නැහෙ යොදා ගන්නේ බොහෝම ශාන්ත පාට. ඒ වගේම කළු ඉරිවලින් වට නොකර එළිය අඳුරින් උපයෝගී කරගෙන බොහෝම රූමත් යශෝධරාව ඇඳලා. කරුණාතිලකගේ පරිවර්තන පොත් අතරේ එන ''රයිඩර් හැගාර්ඩ්ගේ ''අයෙෂා'' පොතට බන්දුල ඇන්දේ මීට හාත්පසින්ම වෙනස් වර්ණවත් සරාගික කාන්තාවක්. ටී.බී. ඉලංගරත්නගේ ''යුගයක ගමන'' පොත් කවරයට බන්දුල ඇන්දේ ලොකු වටපිටාවක් මැද්දෙ පෝට්‍රේට් ක්‍රමයටත් චිත්‍රකතා ආරෙටත් අතර මැද නිර්මාණයක්. ජයකොඩි සෙනෙවිරත්නගේ ''රන්කුසලාන'', ''අම්මයි දුවයි'', ටෙනිසල් පෙරේරාගේ ''මම චක්‍රවර්තී'' පොත් කවරත් බොහෝම සිත් ගන්නවා.

ගැමි චරිත, එදිනෙදා සමාජයේ හම්බ වෙන චරිතවලට බන්දුල හරිස්චන්ද්‍ර වැඩියෙන් උනන්දු වෙද්දී තරුණකම සරාගී බව පෙන්වන චිත්‍රවලට හපන්කම් පෙන්වන ජනක රත්නායක ශිල්පියාගෙන් හිත් බැඳ ගන්න කවර බොහෝමයක්ම තියෙන බව මට මතකයි. ඒත් මේ පුස්තකාලෙදි නං මට දකින්න ලැබුණෝ කුමාර කරුණාරත්නගේ ''මඟුල් සක්වල, පණ්ඩිත කන්නිමහර සුමංගල හාමුදුරුවන්ගේ ''සංසාර මන්දිර'', ඩීමන් ආනන්දගේ ''සැඩසුළං'' කියන පොත් ටික විතරයි. මේ කවරවලත් වැඩියෙන්ම පේන්න තියෙන්නේ චිත්‍රකතාවල ස්වරූපයමයි. හැබැයි ජනක පාට මුහු කරන කොට ටිකක් ඉන් මිදෙන්න උත්සාහ කරනවා.

ඉතින් මං ඔය ලියාගෙන ලියාගෙන ගියේ මට මෙහෙ පුස්තකාලයේ දකින්න ලැබුණ ඒවා ගැන විතරයි. ලංකාවේ විතරක් නෙවෙයි, මෙහෙත් ඉන්නවා කවර නොයෙක් විදියට හදපු අය. ඒ හැමෝම ගැන ලියන්න අමාරු නිසා මං මෙතනින් නවතිනවා. ඒත් මේ ටික හරි ලිව්වේ මෙහෙමත් කලාවක් තියෙනවා නේද කියලා ඒ ගැන උනන්දු වෙන අයට ඉඟියක් දෙන්නයි.'' පින් ලියවිල්ල හමාර කළා. ඒ අතරේ පන්හිඳත් මොකක්දෝ බලියක් ඇන්දා.

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243